33 වන පිටෙන්

රුධිරයෙන් පිරුණ මූර්ති සහිත සිහින දැකීමෙන් ඔහු බියට පත්වේ. රුධිරය වහනය වන හිස්කබලක් ඔහු නිතරම දකින අතර, එය ඔහු විසින්ම ලේ විලක් මැද සිට අඳිනු ලබන්නකි. වධහිංසනය පිලිබඳ අතීතාවර්ජන, දැඩි කෝපය, සියදිවි නසාගැනීමේ හා මනුෂ්‍ය ඝාතන අදහස්, පරාරෝපණය, ආවේග අවුල්කිරීම, අවධානයේ හා සවිඥඥානකතාවයේ විකෘති, ස්වයං සංජානනයේ විකෘති, අන් අය සමග සබඳතා විකෘති, අන් අය විශ්වාස කිරීමට නොහැක-වීම සහ දිගු කාලීන තබා සාමාන්‍ය ඇගලුම්කම්වත් පවත්වාගෙන යාමට නොහැකිවීම යන ව්‍යාදධිවලින් ඔහු පෙලේ. අන්‍යාකාරයෙන් නිශ්චිත නොකල දැඩි ක්ලමථාබාධයේ :ෑිහධී* රෝග ලක්ෂණ බොහොමය-ක් ඔහු තුලින් විද්‍යාමානවේ.

## වධහිංසනය හා ශ්‍රී ලාංකික සමාජය

අවාසනාවකට මෙන් වධහිංසනය ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ෂණයේ කොටසක් වි තිබේ. රැඳවියන්ගෙන් තොරතුරු ලබාගැනීම පිණිස ඇමෙරිකානු එෆ්බීඅයි සේවය හා ස්කොට්ලන්ඩ් යාඩ් ආයතනය පවා වධහිංසනය යොදා ගන්නේයයි පවසමින් බොහෝ දේශීය නිලධාරින් එය යුක්තිසහගතයයි තර්ක කරති.

ජෙරාර්ඩ් පෙරේරාව වධහිංසනයට ලක්කිරීම හා ඔහුගේ ඝාතනය තුලින් මෙම උභතෝකෝටිකයට වඩා පුලුල් අවධානයක් ලැබුණි. වත්තල පොලීසියේ නිලධාරින් කීපදෙනෙක් වැරදීමකින් ජෙරාර්ඩ් පෙරේරාව මිනීමැරුමක සැකකරු වශයෙන් හඳුනාගෙන අත්අඩංගුවට ගෙන තිබේ. ඔහුව ශාරිරික වධහිංසනයට ලක්කර තිබේ. බාල්කයක එල්ලන ලද ජෙරාර්ඩ් පෙරේරාට මොට ආයුධවලින් පහර දී තිබෙන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට උග්‍ර වෘක්ත අකරණය වැළඳී තිබේ. තුවාලවලින් සුවය ලද පසු ඔහු තමාව වධහිංසනයට පත්කල නිලධාරින්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනුකරණ ලදී. සාක්ෂි දීමට පෙර මහ දාවල් බස්රථයක් තුලදී ඔහුව වෙඩිතබා ඝාතනය කරණ ලදී. ඔහුට වධහිංසා පැමිනවූ නිලධාරින් ඔහුගේ ඝාතනයට සම්බන්ධය.

තවත් අවස්ථාවකදී පාසැල් කැන්ටිමක සොරකමක් ගැන විමර්ෂණයේ යෙදී සිටි පොලිස් නිලධාරින් විසින් වයස 10 හා 12 හේ පාසැල් ලමුන් දෙදෙනෙ-ක්ව වධහිංසනයට ලක්කර ඇත. දෙපාවලින් එල්ලන ලද ඔවුන්ගේ යටිපතුල් වලට පහර දී තිබුන අතර, නියපොතුවලට යටින් උල් වස්තු ඔබා ඇත. මෙම ලමුන් දෙදෙනා වධහිංසනයේ ශාරිරික හා මානසික ප්‍රතිවිපාකවලින් බෙහෙවින් පීඩනයට පත්වූහ.

'අපරාධ කරුවන් නොවන සැකකරුවන්ව හා දේශපාලන සන්දර්භයක් යටතේ අත්අඩංගුවට ගත් ජනයාව වධහිංසනයට ලක්කිරීම 1971 කැරැල්ලෙන් ඇරඹුන ගැටුම් අවදියේදී පටන් පුලුල් වශයෙන් ක්‍රියාත්මක විය. ආරක්ෂක හේතූන් මත නීතිවිරෝධී රැඳවුම් කඳවුරු පවත්වාගෙන ගිය අතර, වධහිංසනයට ලක්කිරීම සාමාන්‍ය දෙයක් වශයෙන් සිදුවිය. උදාහරණයක් වශයෙන්, 71 සමයේදී විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාල රැඳවුම් කඳවුරු වශයෙන් උපයෝගී කරගත් අතර, 88/89 සමය තුලදී යටාරෝ කැෆටිරියාව සැකකරුවන් සඳහා මාරක ගමනාන්තයක් විය. උතුරේ තල්සෙවන කඳවුර එල්ටිටිඊ සැකකරුවන්ව ප්‍රශ්ණ කිරීම සඳහා යොදා ගැනුනි. එල්ටිටිඊද දේවිපුරම්හි ඔවුන්ගේම වධකාගාරයක් පවත්වාගෙන ගියහ.

අධිකරණමය හා විධායක බලාධිකාරිය අතරවූ විශාල අසංතුලිතය තුලින් සමාජ සාධාරණත්වයෙහි ගැඹුරු රික්තයක් බිහිවුන අතර, එමගින් වධහිංසනයට ඉඩක් ලැබුණි. මෙම වසර කීපය තුලදී පුද්ගලයින් රාශියක් ශාරිරික හා මානසික වධහිංසනයේ ගොදුරුවූහ. බොහෝ අය සිය මානසික තුවාල කැලැල් උසුලාගෙන තවමත් නිහඬව දුක්විඳිමින් සිටිති. ජාත්‍යන්තර නීතිය යටතේ වධහිංසනය අපරාධ අතින් සාහසිකම ගණයට වැටෙන එකක් ලෙස සැලකේ. ශිෂ්ඨ සමාජයක් විසින් ඒ ඒ රටවල පවතින වධහිංසන පරිචය තුරන් කල යුතුයි. වින්දිතයින්ට පමණක් නොව ඔවුන්ගේ පවුල්වලටද, අවසාන විශ්ලේෂණයේදී මුලු සමා-ජයටමද එය බලපෑමක් කරයි. වධහිංසනය නිසා රටක ආර්ථිකය, ප්‍රතිරූපය හා ජීවගුණය ආවේදනයට ලක්වේ. එය මහජනයාගේ ශාරිරික හා මානසික සුබීතභාවය ක්‍රමානුකූලව විනාශ කිරීමකි. එය සමාජයේ මූලික පදනම හා අභිමානය දුර්වල කරයි.

# සුභාෂිතයෙන් ..

කොතෙක් ගුන කලත් දුදනන් හට — අසුබ
අකක් පමනවත් නොම කෙරෙති — පිලිලබ
ඒ-උක් රසෙහි සැදුවත් නිඹ බිජු — කිරඹ
උදක් තිත්ත මය පසඟ ම තුරෙහි — නිඹ

## එය ම ගැදි පැදියකින්:

අසුබ දුදනන් හට
කොතෙක් ගුන කලත්
අකක් පමන වත්
පිලිලබ නොම කෙරෙති
ඒ උක් රසෙහි
කිරඹ
නිඹ බිජු සැදුවත්
නිඹ තුරෙහි පසඟ ම
උදක් තිත්ත මය.

## එහි තේරුම:

කිසි ම හොඳ ගුනයක් නැති අසත්පුරුෂයන්ට කොය් තරම් උදව් කලත් - කොය් තරම් දේ දුන්නත් ඔහු අකක් (?) තරම් වත් යමක් ආපසු නොදෙති. කොහොඹ ඇටයක් උක් පැනියේ ගිල්ලා බිම සිටුවා කිරි වත් කොට හැදුවත් එය්න් හැදෙන කොහොඹ ගසෙහි පංචාංගයම තිත්ත ය.

## විස්තර කිරීම:

මේ කවියේ තේරුම ගත යුත්තේ තමන්ගේ අද්දැකීමෙනි. මෙහි වචන ගැලපීම ඉතා දුර්වලය.

සුබ දුදනන් නැති නිසා "අසුබ දුදනන්" යන්නේ ඇති "අසුබ" තේරුමක් නැති වචනයකි. "දුදනන්" යන වචනයට හොඳ - නරක, සුබ - අසුබ වැනි විශේශන පද නොගැලපේ. සුබ/අසුබ මිනිසුන් ගෑනුන් ගැන මා අසා නැත. සිය බසේ සුබ/අසුබ යන වචන යෙදෙන්නේ වෙනත් අරුතකිනි. සුබ මොහොත/දිනය/නැකත/අවිරුද්ද වැනි යෙදුම්වල ඇත්තේ වෙනත් අරුතකි.

"අකක්" යනු අක් ගෙඩියකැය් කියති. අක් ගසක් නොහොත් වැලක් හෝ ගෙඩියක් දැක නැති, ඒ දැකපු කෙනකු වත් දැක නැති මට ඒ ගැන යමක් කිව නොහැක. මගේ අදහස නම් අකක් යනු අංශුවක් යන තේරුම දීම සඳහා යොදා ඇති බවය්.

පිලිලබ යනු "ප්‍රතිලාබ" යන්න එලුවට බිඳ ගත් සැටිය්. - ප්‍රතිලාබ/පිලිලබ කිරීම" යන වියහරක් මා අසා නැත.

කිරඹ යන්න කිරිත් අඹත් යන විදියට බෙදා ගෙන සමහරු "කිරිත් වතුරත්" යනුවෙන් එය තේරුම් කරති. එය සදෙස් යය් සිතමි. වංගෙඩිය යන්නේ "වෙනත් සහ ගෙඩියක් " යන අදහස නැත. මෝල්ගහ යන්නේ - මෝලක් සහ ගසක්" යන අදහස නැත. ඔලු ගෙඩිය, බඩ ගෙඩිය, ගල් ගෙඩිය, පාංගෙඩිය, බිත්තර ගෙඩිය යන තැන්වල ගෙඩි නැත. කෙස් ගහ, කොසීඩි ගහ, ලොංගහ, කුඹ ගහ යන තැන්වල ගස් නැත.

"කිරි දියෙනී දෙවියත් - අඟුරු සුදුවන කලෙක් නම් නැත්." කිරිදිය - දියකිරි - දීකිරි යන පද තුන අරුත් තුනක් දෙන බව පෙනේ. කිරිදිය = තනි කර කිරි, දියකිරි = මිටි කිරිවලට පසුව ගන්නා කිරි, දී කිරි = මුදවාපු කිරි (දදි) ආදි වශයෙනි.

සමන් කුළ = සමනළ වෙතත් (සමන් කුළ කන්ද) සමනල කන්දකුත්, සිහි ගිරි = සිහිගිරි = සීගිරි වෙතත් (සිහි ගිරි පව්ව/ගල) සීගිරි පව්වකුත් වහරට පැමින ඇති සැටි බලන්න. -ඒ - උක් - රසෙහි - කිරඹ - නිඹ - බිජු සැදුවත්" යන්නෙන් දී ඇත්තේ, උක් පැනියේ ගිල්ලා සිටවූ කොහොඹ ඇටය (වතුර වෙනුවට) කිරි වත් කොට හැදුවත් ... යන තේරුමය්.

වි.ක. ධර්මබන්ධු

**Do You Want To Migrate To Australia?**

**For All Your Australian Migration Visa Requirements**

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

**We provide professional and cost effective service to our clients.
Step by step assistance and guidance until the end.**

**Ananda Kumarasiri**
**Australian Migration Consultant**
Dip. Marketing
Grd. Cert. Imm. Law -VU
MIB (Inr.Trade) –DU

**Contact Details:**
No 1 Heathcote Court, Endeavour Hills, Vic 3802, Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden, Battaramulla, Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com



**Professional dedication to make your dreams become a reality.**

MASS Design - Sri Lanka. www.massadvertising.net / www.mass.lk / admass@sltnet.lk